කාන්තා හා ළමා කටයුතු අංශය
ප්‍රසූතිකාධාර සංශෝධන පනත්
චක්‍රලේඛ අංක : 3/2021
දිනය : 2021.02.19

සියලුම කම්කරු කොමසාරිස්වරුන්,
නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්,
සහකාර කම්කරු කොමසාරිස්වරුන් හා
කම්කරු නිලධාරීවරුන් වෙත,

**2018 අංක 15 දරන සූතිකාධාර (සංශෝධන) පනත හා 2018 අංක 14 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත**

උක්ත කරුණට අදාලව බොහෝ කාර්යාල වෙතින් නිරන්තරයෙන් උපදෙස් ඉල්ලා විමසීම් කරන බැවින්, ප්‍රසූතිකාධාර ගෙවීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

1939 අංක 32 දරන සූතිකාධාර ආඥා පනතට ගෙන එනු ලැබූ උක්ත සංශෝධනය මගින්, ප්‍රධාන වශයෙන් පහත වෙනස්කම් සිදුකර ඇත.

i. සියලුම සජීවී දරු උපත් සඳහා සමාන ප්‍රතිලාභ ලබා දීම.

ii. විකල්ප ප්‍රසූතිකාධාර ක්‍රමය ඉවත් කිරීම.

iii. ප්‍රසූත නිවාඩු වශයෙන් හිමි සති ගණන තුලට ඇතුලත් වන අනෙකුත් නීති යටතේ හිමිකම් ලබන නිවාඩු දින ගණනද ප්‍රසූත නිවාඩු කාලයට අමතරව භුක්ති විදීමට ඉඩ සැලසීම.

2. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතට ගෙන එනු ලැබූ උක්ත සංශෝධනය මගින්,

   i. සියලුම සජීවී දරු උපත් සඳහා සමාන ප්‍රතිලාභ ලබා දීමත්

   ii. මව්කිරි ලබා දීම සඳහා ප්‍රසූතිකාධාර පනතට සමානව විවේක කාලයන් ලබා දීම නීතිගත කිරීමත් සිදු කර ඇත.

3. ඒඅනුව, ඒ ඒ පනත යටතේ ප්‍රසූත නිවාඩු ගණනය කළ යුතු ආකාරය හා පනත් දෙක යටතේ මව්කිරි දීමේ විවේකය ලබාදිය යුතු ආකාරය I, II හා III ඇමුණුම් මගින් උදාහරණ සහිතව පැහැදිලි කර ඇත. පනතේ කිසියම් හෝ උල්ලංඝනය කිරීමක් පවතින අවස්ථාවන්හිදී, 1986.02.28 දිනැති නඩු පැවරීමේ චක්‍රලේඛ 11 අනුව සාක්ෂි රැස් කර සාක්ෂි සාරාංශ සමග

කම්කරු කොමසාරිස්, කාන්තා හා ළමා කටයුතු අංශය මගින් කම්කරු කොමසාරිස් නීති ක්‍රියා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

4. ප්‍රසූතිකාධාර ගෙවීම සම්බන්ධයෙන් පවතින අනෙකුත් කරුණු ඇමුණුම IV මගින් පැහැදිලි කර ඇත. ඒ අනුව ප්‍රසූතිකාධාර ගෙවීම පිළිබඳව මේ දක්වා නිකුත්කර ඇති චක්‍රලේඛ හා උපදෙස් සියල්ල මෙමගින් අවලංගු කරමි.

5. මෙම චක්‍රලේඛය 2021-02-19 දින සිට ක්‍රියාත්මක වේ.

ඇමුණුම I : ප්‍රසූතිකාධාර පනත යටතේ ප්‍රසූත නිවාඩු ගණනය කිරීම

ඇමුණුම II : සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ප්‍රසූත නිවාඩු ගණනය කිරීම

ඇමුණුම III : මව්කිරි දීම සඳහා විවේක කාල ලබා දීම

ඇමුණුම IV : ප්‍රසූතිකාධාර ගෙවීම සම්බන්ධ අනෙකුත් කරුණු.

බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව

නීතිඥ බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

ඇමුණුම I

**(අ) ප්‍රසූතිකාධාර පනත යටතේ ප්‍රසූත නිවාඩු ලබා දීම.**

(I) මෙහිදී ඕනෑම සජීවී දරු ප්‍රසූතියක් සඳහා ප්‍රසූතියට පෙර සති 02 ක් හා ප්‍රසූතියට පසු සති 10 ක් වශයෙන් වන සති 12 ක ප්‍රසූත නිවාඩුවක් හිමි වේ. අජීවී දරු ප්‍රසූතියක් සඳහා ප්‍රසූතියට පෙර සති 02 ක් හා ප්‍රසූතියට පසු සති 04 ක් වශයෙන් සති 06 ක නිවාඩුවක් හිමි වේ. ප්‍රසූතියට පෙර සති 02 ක නිවාඩුව ලබා නොගත් අවස්ථාවන්හිදී, ප්‍රසූතියෙන් පසු සති 10 ක කාලය හෝ සති 04ක කාලය අවසන් වී මෙන් ඉක්බිතිව ප්‍රසූතියට පෙර භුක්ති නොවිඳි නිවාඩු දින ගණන භුක්ති විඳීමට අවසර ලබා දිය යුතුය. එම සති 12 හෝ සති 06 තුලට ගැනෙන පෝය නිවාඩු දින ගණන, හා එම සේවිකාව ආවරණය වන පඩි පාලක සභා තීරණ හෝ සාමූහික ගිවිසුම අනුව හිමිකම් ලබන සති නිවාඩු දින ගණන හා ප්‍රසිද්ධ නිවාඩු දින ගණන, එකී සති 12 හෝ සති 06 නිවාඩුව අවසන් වන දිනයේ සිට අතිරේකව භුක්ති විදිමට ඉඩ ලබා දිය යුතුය.

(II) වැඩ කරන සතියකදී කෙටි වැඩ දිනයක් පවතින පඩිපාලක සභා වලදී, එම දිනය එක් සම්පූර්ණ වැඩකරන දිනයක් ලෙස සලකා ප්‍රසූත නිවාඩුව ගණනය කළ යුතු වේ.

(III) සජීවී දරු ප්‍රසූතියක් සිදු වීමත් සමගම ප්‍රසූත නිවාඩුව සඳහා හිමිකම ලැබෙන බැවින්, ප්‍රසූතියෙන් පසු දරුවා මිය යාම යන හේතුව මත ප්‍රසූතිකාධාරය හා නිවාඩුව අහිමි කළ නොහැකිය. තවද ස්ථිර කාලීන සේවා ගිවිසුමක් හෝ වාර කාලීන සේවා ගිවිසුමක් හෝ ඇතුලත දරු ප්‍රසූතියක් සිදුවූ විට සම්පූර්ණ ප්‍රසූතිකාධාරය ලබාදීමට සේවා යොජකයා බැඳිසිටින සේ සලකා කටයුතු කලයුතුය. මව මිය යාමකදී පමණක්, මරණය සිදු වූ දිනයද ඇතුලත්ව එම දිනය දක්වා අදාල ගෙවීම සිදු කළ යුතු වේ.

(IV) ඉහත සඳහන් අවස්ථාවන්ට පරිභාහිර ගැටළු පවති නම් කාන්තා හා ළමා කටයුතු අංශයේ කම්කරු කොමසාරිස් වෙතින් උපදෙස් ලබා ගත යුතු වේ.

**(ආ) ප්‍රසූත නිවාඩු ගණනය කිරීම**

උදාහරණයක් වශයෙන්, රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ නියුතු කාන්තාවක් 2019.04.01 දින සජීවී දරු ප්‍රසූතියක් සිදු කරයි නම් හා ඇය පූර්ව ප්‍රසූත නිවාඩු ලබා ගෙන නොමැති නම්, ඇයගේ ප්‍රසූත නිවාඩු කාලය වන්නේ 2019.04.01 දින සිට 2019.07.13 දක්වා (2019.07.13 දිනය ද ඇතුලත්ව) වේ. 2019.07.15 දින සේවයට වාර්තා කළ යුතු වේ. පැහැදිලි කිරීම පසු පිටුවෙහි දැක්වේ.

(ඇ) පැහැදිලි කිරීම

| අදල කාලය | හිමි නිවාඩු ගණන | ලබා දිය යුතු නිවාඩු දින ගණන | ගෙවිය යුතු ප්‍රසූතිකාධාර මුදල |
|---|---|---|---|
| 2019.04.01 සිට 2019.06.23 දක්වා වූ කාලය | දින 84 | දින 84 | දෛනික වැටුප * දින 84 |
| 2019.04.01 සිට 2019.06.23 දක්වා පෝය නිවාඩු දින ගණන | දින 03 | දින 02 (පුනි මස පෝය නිවාඩුව සති නිවාඩු දිනයට යෙදී ඇත.) | දෛනික වැටුප * දින 03 |
| 2019.04.01 සිට 2019.06.23 දක්වා සති නිවාඩු දින ගණන | දින 12 | දින 12 | --------- (රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ පඩිපාලක සභා තීරණ අනුව සති නිවාඩුව වැටුප් රහිත නිවාඩුවකි.) |
| 2019.04.01 සිට 2019.06.23 දක්වා ප්‍රසිද්ධ නිවාඩු දින ගණන | දින 04 (අප්‍රේල් 13,14 මැයි 01,19) | දින 04 (අප්‍රේල් 14 සහ මැයි 19 ප්‍රසිද්ධ නිවාඩු දින සති නිවාඩු දිනයට යෙදී තිබුණද, ඒ වෙනුවෙන් ඉදිරි දින 06 ඇතුලත නිවාඩු දිනයක් ලබා දෙන ලෙස පඩිපාලක සභා තීරණ වල ඇතුලත්ව ඇත.) | දෛනික වැටුප * දින 04 |
| 2019.06.23 ට පසුව ලබා දිය යුතු දින ගණන | 02 + 12 + 04= 18 | දින 18 | දෛනික වැටුප*07 |
| ප්‍රසූතිකාධාර වශයෙන් ලබා දිය යුතු මුළු නිවාඩු දින ගණන හා ප්‍රසූතිකාධාර මුදල | | දින 102 (84+18) | දෛනික වැටුප*දින 91 (84+7) |

මෙය 2019 වර්ෂය පදනම් කරගනිමින් සිදුකල ගණනය කිරීමක් බැවින් ඒ ඒ ලිත් වර්ෂය සහ අදාල පඩිපාලක සභාව අනුව නිවාඩු දින ගණන වෙනස් වන බව සටහන් කර ගතයුතුය.

මූලික වැටුප, ජීවන වියදම් දීමනා හා ඊට සමාන දීමනා හා අයවැය සහන දීමනාවන්ගේ එකතුව පදනම් කරගනිමින් දෛනික වැටුප ගණනය කළ යුතුය.

ප්‍රසූතිකාධාර වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් හෝ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් ගෙවීම අනිවාර්ය නොවේ.

ඇමුණුම II

(අ) සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ප්‍රසූත නිවාඩු ගණනය කිරීම

i). මෙහිදී ඕනෑම සජීවී දරු ප්‍රසූතියක් සඳහා ප්‍රසූතියට පෙර වැඩ කරන දින 14 ක් හා ප්‍රසූතියට පසු වැඩ කරන දින 70 ක් වශයෙන් දින 84 ක පූර්ණ පාරිශ්‍රමික සහිත ප්‍රසූත නිවාඩුවක් හිමි වේ.

ii).ප්‍රසූතියට පෙර දින 14 ක නිවාඩුව ලබා නොගත් අවස්ථාවන්හිදී, ප්‍රසූතියෙන් පසු හිමි දින 70 අවසන් වීමෙන් ඉක්බිතිවම එකී ප්‍රසූතියට පෙර ලබා නොගත් නිවාඩු දින ගණන භුක්ති විඳීමට අවසර ලබා දිය යුතුය.

iii).අජීවී දරු ප්‍රසූතියක් සඳහා ප්‍රසූතියට පෙර වැඩ කරන දින 14 ක් හා ප්‍රසූතියට පසු වැඩ කරන දින 28 ක් ලෙස දින 42 ක පූර්ණ පාරිශ්‍රමික සහිත ප්‍රසූත නිවාඩුවක් හිමි වේ. ප්‍රසූතියට පෙර ලබා නොගත් නිවාඩු දින ගණන, ප්‍රසූතියට පසුව හිමිවන නිවාඩු දින ගණන අවසන් වීමෙන් ඉක්බිතිවම ලබා ගැනීමට ඉඩ ලබා දිය යුතුය.

iv).පූර්ණ පාරිශ්‍රමික සහිත දින ගණන, ගණන් ගැනීමේදී දිනයක හා දින භාගයක සති නිවාඩු ගණන, පෝය නිවාඩු ගණන හා පනතෙන් නියම කර ඇති ප්‍රසිද්ධ නිවාඩු ගණන අතහැර වැඩ කරන දින 84 හෝ දින 42 ගණනය කළයුතු වේ.

v).උදාහරණයක් වශයෙන්, කාර්යාල සේවිකාවක් 2019.04.01 දින සජීවී දරු ප්‍රසූතියක් සිදු කරයි නම් හා ඇය එතෙක් ප්‍රසූත නිවාඩු ලබා ගෙන නොමැති නම් හා සෙනසුරාදා වරු දිනය හා ඉරිදා සති නිවාඩු දිනය වන්නේ නම් ඇයගේ වැඩ කරන දින 84 ක ප්‍රසූත නිවාඩු කාලය 2019.07.24 දින වරුවකින් අවසන් වේ. වැඩිදුර පැහැදිලි කිරීම පසු පිටුවෙහි දැක්වේ.

(ආ) පැහැදිලි කිරීම.

2019.04.01 දින සිට පටන් ගන්නා එක් එක් සතිය සඳහා වැඩ කරන දින ගණන පහත ආකාරයට වගුගත කර දැක්විය හැකිය.

| සතිය | නිවාඩු දින | වැඩ කරන දින | සමුච්චිත දින ගණන |
|---|---|---|---|
| 01 | සති නිවාඩු දින ½ | 5 ½ | 5 ½ |
| 02 | සති නිවාඩු දින 1 ½ + ප්‍රසිද්ධ නිවාඩු දින 01(අප්‍රේල් 13) | 4 ½ | 10 |
| 03 | සති නිවාඩු දින 1 ½ + ප්‍රසිද්ධ නිවාඩු දින 01(අප්‍රේල් 14) + පෝය නිවාඩු දින (අප්‍රේල් 19) | 3 ½ | 13 ½ |
| 04 | සති නිවාඩු දින 1 ½ | 5 ½ | 19 |
| 05 | සති නිවාඩු දින 1 ½ + ප්‍රසිද්ධ නිවාඩු දින 01 (මැයි 01) | 4 ½ | 23 ½ |
| 06 | සති නිවාඩු දින 1 ½ | 5 ½ | 29 |
| 07 | සති නිවාඩු දින 01 + පෝය නිවාඩු දින 01(මැයි 18) | 05 | 34 |
| 08 | සති නිවාඩු දින 1 ½ ප්‍රසිද්ධ නිවාඩු දින 01 (මැයි 19) | 4 ½ | 38 ½ |
| 09 | සති නිවාඩු දින 1 ½ | 5 ½ | 44 |
| 10 | සති නිවාඩු දින 1 ½ | 5 ½ | 49 ½ |
| 11 | සති නිවාඩු දින 1 ½ | 5 ½ | 55 |
| 12 | සති නිවාඩු දින 1 ½ + පෝය නිවාඩු දින 01 (ජූනි 16) | 5 ½ | 60 ½ |
| 13 | සති නිවාඩු දින 1 ½ | 5 ½ | 66 |
| 14 | සති නිවාඩු දින 1 ½ | 5 ½ | 71 ½ |
| 15 | සති නිවාඩු දින 1 ½ | 5 ½ | 77 |
| 16 | සති නිවාඩු දින 1 ½ + පෝය නිවාඩු දින 01 (ජූලි 16) | 4 ½ | 81 ½ |
| 17 | සති නිවාඩු දින 1 (ජූලි 21) | 2 ½ (ජූලි 24 දින වරුයෙන් සේවයට වාර්තා කිරීම.) | 84 |

සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ පාරිශ්‍රමික ගෙවන ආකාරයට ප්‍රසූත නිවාඩු කාලය සඳහාද පූර්ණ පාරිශ්‍රමිකය (2015 අංක 36 හා 2016 අංක 04 දරණ පනත් යටතේ ගෙවිය යුතු අයවැය සහන දීමනා ද, ජීවන වියදම් දීමනා හා ඊට සමාන දීමනා ද ඇතුලත්ව) ගෙවිය යුතු අතර ඒ සඳහා සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්ද ගෙවිය යුතු වේ.

ඇමුණුම III

මව්කිරි දීම සඳහා විවේක කාල ලබා දීම

1. පනත් දෙක යටතේම සමාන ප්‍රතිපාදන ලබා දී තිබේ.

II. දරුවාට වයස අවුරුද්දක් වනතුරු සම්පූර්ණ වැඩ දිනයකදී( පැය නමයක කාලයක) දී මව්කිරි දීමේ විවේක කාල දෙකක් සඳහා ඉඩ ලබා දිය යුතුය.

III. දාරකාගාරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක් සලසා ඇති අවස්ථාවකදී එක් එක් විවේක කාලය විනාඩි 30 කට නොඅඩු විය යුතුය. ඒ අනුව දරුවාට වයස අවුරුද්දක් සපිරෙන තෙක් මව්කිරි ලබාදීම සඳහා ලබාදෙන විවේකය ලබාදීමේදී සේවිකාවක් සේවයේ යෙදවිය හැක්කේ දිනකට පැය 07 ක උපරිම කාලසීමාවක් පමණි.(ආහාර ගැනීම සඳහා ලබාදෙන විවේකය හැර)

IV. දාරකාගාරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක් සලසා නොමැති අවස්ථාවකදී එක් එක් විවේක කාලය එක් පැයකට නොඅඩු විය යුතුය. ඒ අනුව දරුවාට අවුරුද්දක් සපිරෙන තෙක් මව්කිරි ලබාදීම සඳහා ලබාදෙන විවේකය ලබාදීමේදී සේවිකාවක් සේවයේ යෙදවිය හැක්කේ දිනකට පැය 06 ක උපරිම කාලසීමාවක් පමණි. (ආහාර ගැනීම සඳහා ලබාදෙන විවේකය හැර)

V. මෙහිදි නිලධාරින්ගේ අවධානය යොමුකළ යුතු විශේෂ කරුණක් වන්නේ,ප්‍රධාන කාර්යාලයේ පමණක් දාරකාගාරය පවත්වා ශාඛා කාර්යාල වල සේවිකාවන්ටද පැය ½ බැගින් විවේක කාල ලබා දීමට සේවායෝජකයන් කටයුතු කළ හැකි බැවින්, දාරකාගාරය සේවිකාවගේ වැඩ කරන පරිශ්‍රයේම පවතී ද යන්න හා දරුවා එම ස්ථානයට රැගෙන ඒමට හැකිද යන්න ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී පරික්ෂා කිරිමයි.

VI. විවේක කාලයන් දෙක ලබා ගන්නා වේලාව තීරණය කිරීම මවගේ කැමැත්ත අනුව සිදු කිරිමට ඉඩ සලසා දිය යුතු වේ.